# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..







ජගත් ජේ එදිරිසිංහ

# අසඩක් ගිය පසු

අපේ කාලයේ වීරවරයෝ සමුගනිමින් සිටිති. අවසරයක් නොගෙනම හොර රහසේම ඔවුහු නික්ම යති. හදවතේ ඇතිවන පුරවාගත නොහැකි මහා හිස් තැන පමණක් ඉතිරි කර ඔවුහු අපෙන් දුරස්ව යනු දැනෙන විට දැනෙන වේදනාව අපමණ ය.

"අසඩක් ගෘෂා සොයා ගොස් ඇත" පුවත පළමුව මට දැන්වූයේ තරංග ජයසේන ගේ ඊමේලයයි.

"විහිලුවක් ද..?" මම ඇසුවෙමි.

"නැහැ.. දැන් ටිකකට ඉස්සෙල්ල... confirmed.."ඔහු පෙරළා ලීවේ ය.

මම හැඟීම් විරහිතව බලා සිටියෙමි.

හෙන්රි ජයසේනයන් හා අප අතර හිතවත්කම ඇතිවන්නේ අහම්බෙනි. ඔහු සිය ජීවිත කතාව ලියමින් සිටියේ ය. "කරළියක කතාවක්" "නිමිනැති කතාවක්" නමින් ඔහු ලියාගෙන යමින් සිටි එම පොත් පෙළේ යම් අඩුවක් තිබේ යයි මට සිතුණි. සිය ජීවිත කතාවේ ඔහුට සඳහන් කරන්නට අතපසු වූ කලා කටයුත්තක් ඇති බව මට පෙනුණි.

80 දශකයේ මුල භාගයේ හෝ 70 දශකයේ අගභාගයේ ලේක්හවුසියෙන් ප්‍රකාශයට පත් කළ සතුට චිත්‍රකතා පුවත්පතේ අපූරු ළමා චිත්‍ර කතාවක් පළවිය. කතාවේ නම "හාවුන් හඳේ අල්ලං අල්ලං.." නම් විය. ළමුන් වෙනුවෙන්ම සැකසුණ මා කියවූ හොඳම සිංහල චිත්‍රකතාව මේ යයි මට අදත් සිතෙයි.

මේ අපූරු චිත්‍රකතාව ඇන්දේ ඩී සී කරුණාරත්න බව මගේ මතකය කියයි. 70 දශකයේ තිරගත වූ "අතීතයෙන් කතාවක්" නම් වූ වර්ණ ළමා චිත්‍රපටයේ ඇතුළත් වූ චිත්‍ර ඇන්දේ ඩී සී කරුණාරත්න ය. "අතීතයෙන් කතාවක්" ලංකාවේ ප්‍රථම ළමා චිත්‍රපටය යයි සිතමි.

"හාවුන් හඳේ අල්ලං අල්ලං.." කතාවේ චරිත තුනකි. පැංචා පුංචා හා හා පිංචි යන දරුවන් දෙදෙනාත් දැරියත් ය. පුංචා කල්පනාකාරයා ය. පණ්ඩිතයා ය. ඔහුගේ එකම අරමුණ දඬුමොණරයක් සෑදීමය. පිංචි ට පුංචා අල්ලන්නේ නැත.

කුස පබාවතී කතාව කියන විට පිංචි ගේ හිතේ කුස රජු ලෙස ඇඳෙන්නේ පුංචාව ය. පුංචාට පිංචි පෙනෙන්නේ ඒ කතාවේ



මැහැල්ල සේ ය. දෙන්නා හැමවිටම පැටලෙති. පැංචා මැදට වී දෙදෙනා සමගි කරවයි.

දඬු මොණරය සෑදීම සඳහා හැඩ රුව බලා ගැනීමට මොණරකු අල්ලා ගත යුතු යයි පුංචා කියයි.

"කොහොමද මොණරා අල්ලා ගන්නෙ..?"

"මොණරා ඉස්සරහ මොණර නැටුමක් නටන්න ඕනෙ.. මොණරා ඒකට වශී වෙලා බලං ඉන්න-කොට අපි අල්ලා ගන්නවා.."

"කවුද මොණර නැටුම නටන්නෙ..?"

"පිංචි.."

මොණරා අල්ලා ගැනීම සඳහා මොණරා ඉදිරියේ මොණර නැටුමක යෙදෙන්නට පිංචි එකඟකරවා ගන්නට පුංචා සමත් වෙයි.



කතාව ඉදිරියට යන්නේ ඒ ආකාරයට ය.

මේ සුන්දර කතාව ලිව්වේ වෙනත් කිසිවකු නොව හෙන්රි ජයසේන ශූරීන් ය. කතාවේ අනවශ්‍ය දෙබස් නොවීය. තිබූ දෙබස් ද ඉතා ප්‍රාණවත් විය.

මම මේ සුන්දර ළමා කතාව සිහිපත් කරවමින් හෙන්රි ජයසේන ශූරීන්ට ලිපියක් තැපැල් කළෙමි. මා පුදුමයට පත් කරමින් ඔහු හැරෙන තැපෑලෙන් පිළිතුරු ලිපියක් එවුවේ ය. ".. ඔබ කියන තුරු මටත් ඒක අමතක වෙලයි තිබුණෙ..." ඔහු ලියා තිබුණි.

එයින් ඇරඹුන අපේ ලිපි ගණුදෙනුව අතරේ මම ලංකාවට ගිය සෑම අවස්ථාවකදීම ඔහු හමුවන්නට අමතක නොකළෙමි. මගේ පළමු මුද්‍රිත කෘතිය වූ "කන්ද උඩ මාලිගාව" මා මුලින්ම පිදුවේ ඔහුට ය.

"අද සුබ වැඩක් කරන සුබ දවසක් නිසා ඔන්න මං කිරිබත් හැදුවා.." මානෙල් ජයසේන මහත්මිය ඒ සුන්දර උදෑසන කීවා ය. සියල්ලට පෙර අපි ඒ රසවත් කිරිබතින් සප්පායම් වූයෙමු.

මගේ "සිසිරයේ පිපුණ මල" කාව්‍ය සංග්‍රහයේ පසුපිට කවරයේ සටහන ද ලියැවුණේ හෙන්රි ජයසේනයන් අතිනි.

අපේ හිතවතෙකු වන සුමේද රත්නසේකර වරක් "මකරා" නාට්‍යයේ නව පරිවර්තනයක් මෙල්බන්හි වේදිකා ගත කරන්නට සැළසුම් කළේ ය. හෙන්රි ජයසේනයන් හමුවූ අවස්ථාවකදී මම මේ කාර්යයට යම් සහයක් ලබා දිය හැකි දැයි ඇසුවෙමි.

"ආයෙ කවුරුත් මකරා හදන්න අවශ්‍ය නැහැ ජගත්.. ඒක මං හදලා ඉවරයිනෙ.." ඔහු කෙළින්ම කීවේ ය. ".. වෙන එකක් තියා ධර්මසිරි මකරාක්ෂයා හැදුව එක ගැනවත් මගේ පැහැදීමක් නැහැ.."

මගේ ඉල්ලීම පරිදි සන්නස පුවත්පත සඳහා කොළමක් ලියන්නට ඔහු කැමති විය. මාසයක් දෙකක් පමණ ලියූ ඒ ලිපිය අතරමග ඇණ හිටිය නමුදු ඒ බව සිහිපත් කර ඔහු වෙහෙකරවන්නට මට නොසිතුණි. මානෙල් අක්කා ගේ අභාවය පිලිබඳව ඔහු මහත් සේ කම්පාවට පත් සිටි බැවින් ය.

ළබන වසරේ ජනවාරි මාසයේ 9 වන දා මගේ "රාජාලි පියාපත" කාව්‍ය සංග්‍රහයත් "ඉස්කෝලෙ කාලේ" යොවුන් නවකතාවත් "තාරකා විජිතය" නවකතාවත් එළි දක්වන්නට සැළසුම් කෙරෙමින් තිබෙයි. ඒ උත්සවයේ ආරාධිත කථිකයකු වීමට සිටියේ හෙන්රි ජයසේනයන් ය.

එයට පෙර ඔහු යන්නට ගියේ ය.

## අසඩක්

විනිසුරු අසුනසල
වැතිර සිටියෙමි එදවස
තබා අත හිස මත
මහා බර කටහඬ අවදිකොට
කීවෝය සැනසුම් බසක්
අසඩක් විනිසුරාණෝ

හදවත පෙළුෑ බර පොදි
එකිනෙක අතින් ගෙන
තබා බිම මා ඉදිරියේ
සිනාසුණහ බෝ
සැහැල්ලුවෙන්
අසඩක් විනිසුරාණෝ

වියපත් මගේ හද තුළ
මේසා කලක් රැක ගත්
දුටුවෙද මෙබර නිම්නැති
සසඳා බැලියැකිද
වෙනත් හදවතක බර හා
අසා සිටියෝය හිනැහී
අසඩක් විනිසුරාණෝ

බිම තබා බර පැස
විනිසුරු අසුණින් බැස
දැන් බෝ දුරක් ගොස් ඇත
අසඩක් විනිසුරාණෝ
තවමත් මෙතැනමය මම

ජගත් ජේ එදිරිසිංහ
2009 නොවැම්බර් 10